9 වන පිටෙන්

ප්‍රදර්ශනය කලේය. දුරකතනය ඔස්සේ ඊළඟ මොහොතේ සභාපතිවරයා ඇමතූ බැසිල් අසා සිටියේ 'තමුන්ගේ ඉල්ලා අස්වීමේ ලියුම ගම්පහට පැමිණ භාරගන්නවා ද..... නැති නම් කාර්යාලයට ගෙනවිත් භාරදෙන්න ද...” යනුවෙන් පමණි. පැය කිහිපයක් ඇතුලත දී බැකෝ යන්ත්‍ර සැපයීන.

අද රටට අවශ්‍ය වන්නේ එබඳු සෘජු තීරණ, නියෝග යටතේ ක්‍රියාත්මක වන කඩිනම් සංවර්ධන වැඩ පිළිවෙලක් නොවේ යැයි කිසිවකු හෝ නොකියනු නොඅනුමානය. ඒ වගේම ජනතාවගේ අතමිට සරුවන ආර්ථිකයකි. කොමිස් ගැනිලි, යටිමඩි

***<u>ප්‍රජාත්‍රාන්තික නායකයකු යටතේ වැඩකරන ඇමතිවරුන් අතරේ සමහර විට ලෝකයේ අලිමඇලි අමාරුකාර තක්කඩින් සිටින්නට බැරි නැතැයි ඉහතින් මා පැවසුවේ එබැවිනි.</u>***

වැඩ නැති රටේ දියුණුවට වැඩ කරන මැති, ඇමති මණ්ඩලයකි. ජනාධිපතිවරයාගේ අරමුණ වී ඇත්තේ ඉදිරි වර්ෂ කීහිපය තුලදී ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්ය කිරීමටය. යුද්ධය ද අවසන් ය. ජනතාවගේ මෙම අහිංසක බලාපොරොත්තු ඒ ආකාරයටම ක්‍රියාත්මක වන්නේ දැයි ගවේෂණය කොට සත්‍ය ජනතාව හමුවේ තැබීමට ප්‍රබල විපක්ෂයක් රටට අවශ්‍යයි. එජාපයේ අනාගතය තීරණය වන්නේ සිය පක්ෂයේ අභිත ශක්තිය හා මතු දැක්වූ අභියෝග ජයගන්නට ගෙන එන සූර වීර වැඩ පිළිවෙලකින් පමණි.

පසුගියදා පත් කල නව ඇමති මණ්ඩලයේ සමහරු තවමත් දෙපාර්තුමේන්තු , මණ්ඩල හා සංස්ථා භාරව කලින් සිටි ඇමතිවරුන්ගේ ක්‍රියාකලාපය දෝෂාරෝපණයට ලක්කරති. විශේෂයෙන් පසුගිය ඇමති මණ්ඩලයේ හිටපු වගකිව යුතු ප්‍රබල ඇමතිවරුන් නව ඇමතිවරුන්ගේ දෝෂාරෝපනයට ලක් වීම වත්මන් ආණ්ඩුවේ මා දුටු විශේෂත්වයකි. එය මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ ප්‍රජාතාන්ත්‍රික විනි විද බව පිළිබඳ හැගීමක් ඇතිකරගත හැකි තත්වයක් වශයෙන් ද අර්ථ දැක්වීමට පිළිවන.

ගෑස් සිලින්ඩරයේ මිල රුපියල් දෙදහසකට ආසන්න ප්‍රමාණයේ දක්වා නොබෝදා ඉහළ දැමූ අවස්ථාවේ විද්‍යුත් මාධ්‍යයෙන් ප්‍රවෘත්තියක් අසන්නට ලැබිණ. එම ප්‍රවෘත්තියට ඇතුලත් වුයේ අලුතින් ඛණිජ තෙල් නීතිගත සංස්ථාව භාරගත් ඇමතිවරයාගේ ප්‍රකාශයකි. ඔහු පවසා සිටියේ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව පෞද්ගලික අංශයක් සමඟ ඇතිකරගෙන තිබෙන ගිවිසුමක් නිසා සංස්ථාව විසින් නිපදවනු ලබන ගෑස් වෙළඳපොලට නිකුත් කල නොහැකි තත්වයක් පවතින බවකි. මේ නිසා ඒකාධිකාරියක් ඇති වී ගෑස් මිල පහල දමන්නට බැරිතත්වයක් උද්ගත වී තිබෙන පෙන්වා දුන් එම ප්‍රකාශයේ වැඩිදුරටත් සඳහන් වුයේ මෙම ගිවිසුම අහෝසි කිරීමට නව ඇමතිවරයා පියවරගන්නා බවකි.

ජනතාව පීඩාවට පත්කරවන මෙවැනි ”පිල්මාට්” තවත් බොහෝ ය. මේවා පිටුපස සිටින්නේ ප්‍රබල ඇමතිවරුන් ය. එවැනි ඇමතිවරුන් ජනතා විරෝධි ගිවිසුම් ගසන්නේ පිටරට වලින් බැංකුවලට 'ඩිපොසිට්' වන ලක්ෂ, දෙලක්ෂ, කෝටි ගණනින් වන ඩොලර් කොමිස් හොඳින් අහිමි කර ගැනීම. 'හෙන ගහන අපරාධයක්' සේ සලකන බැවින් ය. ප්‍රජාත්‍රාන්තික නායකයකු යටතේ වැඩකරන ඇමතිවරුන් අතරේ සමහර විට ලෝකයේ අලිමඅලි අමාරුකාර තක්කඩින් සිටින්නට බැරි නැතැයි ඉහතින් මා පැවසුවේ එබැවිනි. වත්මන් සමහර ඇමතිවරුන් හිටපු සමහර ඇමතිවරුන්ගේ යටිමඩි වැඩ ගැන නොකියා කියමින් රටට ඒවා හෙළිදරව් කල ද , එජාප නායකයාට මෙම දූෂණ පාර්ලිමේන්තුවේදී හෙළිදරව් කරන්නට වුවමනාවක් නොතිබුනේ මන්දැයි හැගේ. ඊට පිළිතුරු මෙම ලිපිය පුරාම ලියවී ඇත. එජාපය මඩේ සිටවූ ඉන්නක් නොවූ , අයෝමය ශක්තියකින් හෙබි සීගිරිය මෙන් ප්‍රතාපවත් කඳවුරක් බව ජනතාවට වටහා දිය යුතු කාලය දැන් උදා වී තිබෙන බව නායක රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රමුඛ මන්ත්‍රී මණ්ඩලය දැනවත් තේරුම් ගැනීම පමාවක් නොවේ.

අනුර හොරේෂස් ලියයි.

**ලබන කලාපයේ**

***මීළඟ එජාප නායකයා සජිත් නම් ඔහුට තිබෙන***




